**ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ ව්‍යාපෘතිය - 2014**

---

ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජාසංස) අතර 2012 ජූලි 17 දින එළඹි අංක ටීඑෆ් 6138 (ටීඑෆ් 012186) දරන ණය ගිවිසුමේ උප ලේඛන 2 හී II (ආ) 3 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වන අතර එවකට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වර්තමානයේ මුදල් අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු වනුයේ, දේශීය ගොවීන්ට ඔවුන්ගේ කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා තත්වයෙන් උසස් ගබඩා පහසුකම් සැපයීම, එවැනි නිෂ්පාදන සඳහා තාක්ෂණික ක්‍රම මගින් ගනුදෙනු කළ හැකි සමාන්තර මූල්‍ය සේවා පහසුකම් ක්‍රම සංවර්ධනය කිරීම තුළින් ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ ව්‍යාපෘති ක්‍රියාවට නැගීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 852.8 කට සමාන එජඩො මිලියන 6.5 ක් වූ අතර සමස්ත පිරිවැය ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතාවය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජූලි 17 ආරම්භ කළ අතර 2015 මැයි 31 අවසන් කිරීමට නියමිත විය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද

විගණනයට ඇතුළත් වේ. මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණුකළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන

අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, හා සමාලෝචිත වර්ෂය තුළ දී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදි අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමෙන් මූල්‍යනය කිරීමට එකඟ වූ වටිනාකම | | 2014 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන | අරමුදල් උපයෝජනය | | |
|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) |
| ජා.සං.ස. | 6.5 | 852.8 | 400.0 | 216.4 | 1.8 | 237.9 |
| ශ්‍රී.ලං.ර | - | - | 3.0 | - | - | - |
| එකතුව | 6.5 | 852.8 | 403.0 | 216.4 | 1.8 | 237.9 |

ඉහත සඳහන් තොරතුරු අනුව, රු. මිලියන 852.8 කට සමාන එජඩො මිලියන 6.5 ක මුළු ප්‍රතිපාදනයෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 237.9 කට සමාන එජඩො මිලියන 1.8 ක් පමණක් ව්‍යාපෘතියේ මෙහෙයුම් කාලය වසර 1 ½ ක් අවසන් වන විට උපයෝජනය කර තිබුණි. මේ අනුව ඉතිරි මාස 05 හිදී එජඩො මිලියන 4.7 ක ප්‍රතිපාදන ශේෂය භාවිතා කිරීමේ හැකියාව පිළිබද විගණනයේදී සැක සහිතය.

### 3.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) ලැබුණු තොරතුරු අනුව ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා විශාල ගබඩා 03 ක් ඉදිකිරීමට ව්‍යාපෘතිය කටයුතු කර තිබුණු අතර එයින් හුරුළු වැව ගබඩාවේ ඉදිකිරීම් වැඩ 2015 මැයි මාසයේදී අවසන් කර ඇත. බුත්තල හා මන්නාරම ගබඩා වල 2015 මැයි 31 දිනට භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 55 හා සියයට 20 ප්‍රමාණයේ පැවතිනි.

(ආ) එසේම ලොකු ඇනු වගාවේ නියුතු ගොවීන්ට ඔවුන්ගේම ගබඩා ඉදිකිරීමට මුදල් හා තාක්ෂණික සහයෝගය ව්‍යාපෘතිය මගින් ලබා දී තිබුණි. ලැබුණු තොරතුරු අනුව, ලොකු ඇනු ගබඩා ඉදිකිරීමට ගොවීන් 370 ක් ව්‍යාපෘතිය සමඟ ගිවිසුම් වලට එළඹී තිබුණු අතර 2015 මැයි 31 දින වනවිට, ඉන් ගොවීන් 287 ක් පමණක් ඔවුන්ගේ ගබඩා වල ඉදිකිරීම් වැඩ අවසන් කර තිබුණි.

(ඇ) ව්‍යාපෘතිය මගින් ඉදිරිපත් කළ ලියකියවිලි වලට අනුව, ගොවීන් විසින් ඉල්ලුම් කළ ණය වලට සමාන්තරව ගබඩා ක්‍රියාකරුවන් විසින් වානිජ බැංකු වෙත ඉලෙක්ට්‍රොනික ලදුපත ලබා දීමට යාන්ත්‍රනයක් ඇති කිරීම මගින් ගොවීන්ගේ මුදල් අවශ්‍යතා කඩිනමින් සපුරාලීමට ඉඩකඩ සැලසීමට යෝජනා කර තිබුණි. කෙසේ වෙතත් යෝජිත යාන්ත්‍රනය ස්ථාපිත කිරීමට 2014 දෙසැම්බර් 31 දින වන විටත් ව්‍යාපෘති සම්බන්ධිකරණ ඒකකය කටයුතු කර නොතිබුණි.

## 3.3 මතභේදයට තුඩු දෙන කරුණු

-------------------------------

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, අම්පාර විශාල ගබඩාවේ ඉදිකිරීමේ පරිශ්‍රය බුත්තල වෙත මාරු කර තිබුණු අතර මෙම තීරණයේ ප්‍රතිඵලයක් ලෙස, 2014 නොවැම්බර් 10 දින ගෙවන ලද වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් රු. මිලියන 29.3 ක් 2015 ජනවාරි 26 දින දක්වා කොන්ත්‍රාත්කරු අත රඳවා ගෙන තිබුණි.

(ආ) තාක්ෂණික උපදෙස් සැපයීම, ක්ෂේත්‍ර පරීක්ෂණ සහ ලොකු ඇනු ගබඩා ඉදිකිරීම් සඳහා ගොවීන් වෙත ලබා දුන් මූල්‍ය සහනාධාර සඳහා ලියකියවිලි සකස් කිරීම වැනි කරුණු වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත තාක්ෂණික නිලධාරින් වෙත රු.660,574 ක් ගෙවා තිබුණි.